සියලු ම හිමිකම් ඇවිරිණි

රහස්‍ය ලේඛනයකි

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

# 44 - නැටුම් (දේශීය)

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.

ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
## 44 - නැටුම් (දේශීය)
## අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රය : බහුවරණ ප්‍රශ්න 40කි. (40 x 1) **ලකුණු 40යි.**

II පත්‍රය : 1 වැනි ප්‍රශ්නය කොටස් 10කි. කෙටි පිළිතුරු
- i - viii දක්වා (8 x 1) ලකුණු 08
- ix - x දක්වා (2 x 2) ලකුණු 04

} **ලකුණු 12යි.**

**සෙසු ප්‍රශ්න 6න් (2 - 7 තෙක්) තෝරාගත් ප්‍රශ්න 04කට පිළිතුරු සැපයිය යුතුයි.**

2 වැනි ප්‍රශ්නය i ලකුණු 4
ii ලකුණු 4
iii ලකුණු 4 ලකුණු 12යි.

3 වැනි ප්‍රශ්නය i ලකුණු 4
ii ලකුණු 4
iii ලකුණු 4 ලකුණු 12යි.

4 වැනි ප්‍රශ්නය i ලකුණු 4
ii ලකුණු 4
iii ලකුණු 4 ලකුණු 12යි.

5 වැනි ප්‍රශ්නය i ලකුණු 4
ii ලකුණු 4
iii ලකුණු 4 ලකුණු 12යි.

6 වැනි ප්‍රශ්නය i ලකුණු 4
ii ලකුණු 4
iii ලකුණු 4 ලකුණු 12යි.

7 වැනි ප්‍රශ්නය i ලකුණු 4
ii ලකුණු 4
iii ලකුණු 4 ලකුණු 12යි.

} **12x4 = ලකුණු 48යි.**

**මුළු ලකුණු 100යි.**

- පළමු සහ දෙවන පත්‍රවල ලකුණු දැමීම
- පළමු පත්‍රයේ කවුළුපත් ලකුණු කිරීමේ දී, අදාළ ප්‍රශ්න අංකය ඉදිරියේ හරි වැරදි ලකුණු කරන්න.
- නිවැරදි ලකුණු ගණනය කොට අදාළ පේළිය යට කොටුවෙහි මුළු සංඛ්‍යාව සටහන් කරන්න.
- දෙවන පත්‍රයේ කොටස් ලකුණු දකුණු පස ඇති තීරුවේ ලියා දක්වන්න.
- එක් එක් ප්‍රශ්නයේ කොටස්වලට ලද ලකුණු උත්තරයේ අග ලියා එකතු කොට එය දකුණු පස තීරුවේ ලියා ඒ වටා රවුමක් අඳින්න

Department of Examinations - Sri Lanka



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.
   ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..................................................... √ △ $\frac{4}{5}$
.....................................................
.....................................................

(ii) ..................................................... √ △ $\frac{3}{5}$
.....................................................
.....................................................

(iii) ..................................................... √ △ $\frac{3}{5}$
.....................................................
.....................................................

(03)                    එකතුව  ➡  □ $\frac{10}{15}$

Department of Examinations - Sri Lanka

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
**V. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :-** (I) **සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

Department of Examinations - Sri Lanka



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

## 44 - නැටුම් (දේශීය)

## I ප්‍රශ්න පත්‍රයෙහි අදාළ ඉගෙනුම් ඵල

1. උඩරට. පහතරට, සබරගමු, නර්තන සම්ප්‍රදායන්හි සිද්ධාන්ත පිළිබඳ අවබෝධයෙන් යුතුව පිළිතුරු දෙයි.

2. ගැමි නාටක, ගැමි නැටුම් (සිංහල/ ද්‍රවිඩ). ගැමි ගායනා, පිළිබඳව නිවැරදි කරුණු වෙන්කොට හඳුනාගනියි.

3. දේශිය වාද්‍ය භාණ්ඩවල ව්‍යුහය, වාදන අවස්ථා පිළිබඳව නිවැරදිව කරුණු දක්වයි.

4. දේශීය නර්තන කලා පර්යේෂකයින් හා මුද්‍රා නාට්‍ය ශිල්පීන් පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.

5. නර්තන සම්ප්‍රදායන්හි. රංගවස්ත්‍රාභරණ, රංග භාණ්ඩ, චාරිත්‍ර විධි පිළිබඳව අවබෝධයෙන් යුතුව කරුණු දක්වයි.

6. භාරතීය නර්තන, සම්ප්‍රදායන්හි සුවිශේෂි තොරතුරු සහ ප්‍රාසංගික කලා, නිර්මාණකරණය පිළිබඳව තොරතුරු ප්‍රකාශ කරයි.

Department of Examinations - Sri Lanka



Download all Past Papers>> https://bookbeekid.com/resource/past-papers/

OL/2020/44/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## නැටුම් (දේශීය) I

**විශේෂ උපදෙස්:**

※ සියලු ම අයදුම්කරුවන් **I කොටසේ** ප්‍රශ්න **30** ට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතරව **II උඩරට** නර්තනය හෝ **III පහතරට** නර්තනය හෝ **IV සබරගමු** නර්තනය යන කොටස් **තුනෙන් එක් කොටසකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

※ **II, III** හා **IV** වන කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා **ගොගත යුතු ය.** ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතු ය.

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ** (X) **ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

Department of Examinations - Sri Lanka

## I කොටස

● අංක **1** සිට **10** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.

**1.** අද්භූත රසය උපදිනු ලබන්නේ ............................. නමැති ස්ථායි භාවය මුල් කොට ගෙන ය.
(1) ජුගුප්සා (2) විස්ම (3) ශෝක (4) උත්සාහ

**2.** ගැමි නර්තන අතුරෙන් ............................. නැටුම අවනද්ධ භාණ්ඩයක් අතැතිව ඉදිරිපත් කරනු ලැබේ.
(1) කුලු (2) ලී කෙළි (3) රබන් (4) චාමර

**3.** වන්නම් නර්තනයේ දී භාවිත කරනු ලබන්නේ,
(1) තාලානුකූල චලන වේ. (2) ප්‍රකාශනාත්මක චලන වේ.
(3) රිද්මානුකූල චලන වේ. (4) ස්ථිතික චලන වේ.

**4.** දවුල, සුදු පිරුවටයකින් ආවරණය කරනු ලබන්නේ ........................ වාදනයේ දී ය.
(1) අණ බෙර (2) මඟුල් බෙර (3) මළ බෙර (4) අත්‍යා බෙර

**5.** නිර්මාණකරණයේ දී අවකාශ භාවිතය හා සම්බන්ධ තල සංඛ්‍යාව ........... කි.
(1) දෙක (2) තුන (3) හත (4) අට

**6.** "ගනිමින් චාමර සැලුවේ මුනිඳුට, අපි දැන් දක්වමු මේ රඟ ........................" යන්නෙහි හිස්තැනට ගැළපෙන පදය වනුයේ,
(1) සුරතට (2) මඬලට (3) එතැනට (4) සබයට

7. ත්‍රිවිධ රත්නයට භක්ති පූර්වකව සිදු කෙරෙන ........................ අනාසාතාත්මක ගායනා විශේෂයකි.
(1) පන්තේරු කවි  (2) බුද්ධ ප්‍රශස්ති  (3) නමස්කාර ගාථා  (4) තුන්සරණේ කවි

8. චිත්තරාජ හා කාලවේල යක්ෂයින් උදෙසා සම අසුන් පනවා පණ්ඩුකාභය රජු තමා ඉදිරියේ දෙව් මිනිස් නැටුම් කරවූ බව .......................... සඳහන් වේ.
(1) ධාතුවංශයෙහි  (2) චූලවංශයෙහි  (3) දීපවංශයෙහි  (4) මහාවංශයෙහි

9. පොළොන්නරු යුගයේ, දේවදාසීන් විසින් දෙවියන් උදෙසා නැටුම් පැවැත්වූ බව .............................. සෙල්ලිපියේ සඳහන් වේ.
(1) කාලිංග වනයෙහි ගල් ආසන  (2) පාලමොට්ටායි
(3) සැස්සේරුව  (4) කොරවක්ගල

10. කථකලි නර්තනය ඉගැන්වීම සඳහා කේරළ ........................ පිහිටුවන ලදී.
(1) කලා මණ්ඩලම්  (2) කලා ක්ෂේත්‍රම්
(3) භාත්කණ්ඩ විද්‍යාපීඨය  (4) ශාන්ති නිකේතනය

11. අතීතයේ දී යුද්ධ කටයුතු සන්නිවේදනය සඳහා වාදනය කර ඇත්තේ,
(1) අඩ බෙර ය.  (2) රණ බෙර ය.  (3) බුම්මැඩිය ය.  (4) තම්මැට්ටම් ය.

12. කෝලම් නාටකයේ දී පොතේ ගුරුගේ කාර්ය සිදු කරනු ලබන්නේ,
(1) බෙර වාදන ශිල්පියා ය.  (2) අත්වැල් ගායකයින් ය.
(3) කාරියකරවන රාළ ය.  (4) සභාපතිවරුන් ය.

13. වෙදරාළ සහ මුදලි යන චරිත පිළිවෙළින් දක්නට ලැබෙන්නේ,
(1) සොකරි හා නාඩගම්වල ය.  (2) කෝලම් හා කිඳුරු නාටකවල ය.
(3) කෝලම් හා සොකරිවල ය.  (4) සොකරි හා කෝලම්වල ය.

14. ලක්නව්, ජායිපූර් ගුරුකුලවලට අයත් භාරතීය නර්තන සම්ප්‍රදාය වන්නේ,
(1) කථක් ය.  (2) මනිපුරි ය.  (3) කථකලි ය.  (4) භරත නාට්‍යම් ය.

15. මනිපුරි නර්තනය විෂයයක් ලෙස ඉගැන්වීම ආරම්භ කිරීමට දායකත්වය ලබා දුන්නේ,
(1) රාම් ගෝපාල් ය.  (2) රබීන්ද්‍රනාත් තාගෝර් ය.
(3) නාරායන මෙනන් ය.  (4) උදය ශංකර් ය.

16. පත්තිනි දෙවියන්ගෙන් අවසර පතමින් සිදු කෙරෙන සබ නැටුම් විශේෂයක් වන්නේ,
(1) තාලම් ය.  (2) සවරම් ය.  (3) චාමර ය.  (4) පන්තේරු ය.

17. ප්‍රාදේශිකව පවත්නා වෘත්තීන් තේමා කර ගනිමින් නිර්මාණය වී ඇති ගැමි නැටුම් වනුයේ,
(1) ලී කෙළි සහ ගොයම් ය.  (2) ගොයම් සහ රබන් ය.
(3) රබන් සහ කුලු ය.  (4) කුලු සහ ගොයම් ය.



18. "ඉන්ද්‍ර දිශාවට ඉඹුල් විමානෙට" යන කවිය අයත් වන ගායන විශේෂය කුමක් ද?
(1) ප්‍රශස්ති  (2) නමස්කාර  (3) ග්‍රහපංති  (4) සිරසපාද

19. අතීතයේ දී රජවරුන්ගේ ගුණ ඇතුළත් ගායනා ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) දේව දාසින්  (2) සිංගාරක්කාරයන්
(3) වන්දිභට්ටයින්  (4) තඹරු පුරම්පෙට්ටුකාරයන්

20. දේශීය මුද්‍රා නාට්‍යවල රංග භූමි අලංකරණය හා වෙස් මෝස්තර නිර්මාණයෙහි ප්‍රවීණ චිත්‍ර ශිල්පියකු ලෙස ප්‍රකට වූයේ,
(1) සෝමබන්ධු විද්‍යාපති මහතා ය.  (2) සීබට් ඩයස් මහතා ය.
(3) නිමල් වෙල්ගම මහතා ය.  (4) ඩබ්ලිව්. බී. මකුලොලුව මහතා ය.

21. දේවකෝල්පාඩුව සහ කෝල්පාඩුව යන අංග අයත් නර්තන සම්ප්‍රදායන් වන්නේ පිළිවෙළින්,
(1) පහතරට සහ උඩරට ය.  (2) සබරගමු සහ උඩරට ය.
(3) උඩරට සහ සබරගමු ය.  (4) පහතරට සහ සබරගමු ය.

Department of Examinations - Sri Lanka

22.   

ඉහත ඡායාරූපවල දැක්වෙන ග්‍රන්ථ කතුවරුන් තිදෙනා පිළිවෙළින්,

(1) තිස්ස කාරියවසම්, මුදියන්සේ දිසානායක සහ ජයසේන කෝට්ටගොඩ යන මහාචාර්යවරුන් වේ.
(2) මුදියන්සේ දිසානායක, තිස්ස කාරියවසම් සහ ජයසේන කෝට්ටගොඩ යන මහාචාර්යවරුන් වේ.
(3) මුදියන්සේ දිසානායක, ලයනල් බෙන්තරගේ සහ ආරියරත්න කළුආරච්චි යන මහාචාර්යවරුන් වේ.
(4) ලයනල් බෙන්තරගේ, තිස්ස කාරියවසම් සහ ආරියරත්න කළුආරච්චි යන මහාචාර්යවරුන් වේ.

23. දෙතිතේ තාල රූපය ප්‍රස්තාරකරණයේ දී 'තිත් තෙයි' යන්නට සංකේත වශයෙන් භාවිත වනුයේ,
(1) ∧ / ලෙස ය. (2) / ∧ ලෙස ය.
(3) ∧ ∧ ලෙස ය. (4) / / ලෙස ය.

● අංක **24, 25** සහ **26** යන ප්‍රශ්නවලට පහත තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A නළල් පටිය | E සේලය | I අත්පටි |
| B ශිඛාබන්ධනය | F හැඩ කැල්ල | J රළිසාය |
| C අත්පොට හතර | G දෙවොල් තොප්පිය | K නෙත්තිමාලය |
| D රතු රෙද්ද | H ඉනහැඩය | L පායිම්පත |

24. පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ඇඳුම් පැළඳුම් පමණක් දක්නට ලැබෙන වරණය වන්නේ,
(1) A, E සහ K (2) A, G සහ J
(3) C, G සහ I (4) D, F සහ L

25. සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් පැළඳුම් දක්නට ලැබෙන වරණය වන්නේ,
(1) A, G සහ L (2) B, F සහ K
(3) C, F සහ K (4) C, H සහ L

26. උඩරට සහ සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අයත් නාමිකව සමාන පැළඳුම් පමණක් ඇතුළත් වරණය වන්නේ,
(1) B සහ K (2) F සහ I (3) H සහ L (4) H සහ K

27. ශාන්තිකර්මවල එන නාට්‍යමය පෙළපාළි වන්නේ,
(1) යක්කම් හා දෙවොල් ගොඩබැසීමයි. (2) රාම මැරීම හා විජේරාජ කතාවයි.
(3) ගුරුගේමාලාව හා කොළොන්න පද නැටීමයි. (4) අඹවිද්මන හා වැදි දානයයි.

28. අරුවිවෙට්ටු හා සුලකු යන නම්වලින් හැඳින්වෙන දමිළ නර්තනවලට සමාන වන දේශීය ගැමි නැටුම් දෙක පිළිවෙළින්,
(1) කළ හා කුලු ය. (2) ගොයම් හා කුලු ය.
(3) ලී කෙළි හා කුලු ය. (4) ලී කෙළි හා කළ ය.

29. මනෝහාරබන්ධනම් සහ ජද්දන්තදායම් යන මුද්‍රා නාට්‍යයන්හි ප්‍රධාන නළුවෙක් ලෙස රඟපෑ ශ්‍රීපාලි ශිෂ්‍යයා කවු ද?
(1) ශේෂා පළිහක්කාර (2) නිමල් වෙල්ගම
(3) ජී. රංගනාථ (4) ඒ. ඉඹුල්ගොඩ

30. ප්‍රාසංගික නර්තනයේ දී, මුහුණේ පිහිටීම හා සමේ වර්ණය පිළිබඳ ව වඩාත් සැලකිලිමත් විය යුතු වන්නේ,
(1) අංග රචනයේ දී ය. (2) රංග රචනයේ දී ය.
(3) ආංගික අභිනයේ දී ය. (4) සාත්වික අභිනයේ දී ය.

Department of Examinations - Sri Lanka

## II කොටස - උඩරට නර්තනය

**31.** උඩරට නර්තන සම්ප්‍රදායේ කැරකීම් ක්‍රමයක් ප්‍රගුණ කළ හැකි වනුයේ කීවෙනි ගොඩසරඹය මගින් ද?
(1) 6 (2) 7 (3) 10 (4) 11

**32.** ගැටබෙරයෙහි සුරල වාදනය (සුරල් පෙරළීම) පුහුණුවීම සඳහා වඩාත් යෝග්‍ය සරඹය තෝරන්න.
(1) තකට කුඳට (2) තරි තෙරුඳඩ
(3) තත් තත් කඩ (4) තකට කු ජිං කඩ

**33.** කොහොඹා කංකාරියට අයත් චාරිත්‍ර විධියක් වන්නේ,
(1) තොටමෙට යාමයි. (2) අයිලේ යැදීමයි.
(3) මිල්ල කැපීමයි. (4) පත්තිනි නැටීමයි.

**34.** "කුඳංත ගත දොම්" වට්ටම නර්තනය කළ හැකි තාල රූපය තෝරන්න.
(1) 2 + 2 + 3 (2) 2 + 3 + 3 (3) 2 + 2 + 4 (4) 2 + 3 + 4

**35.** පොල් මල සහ දුන්න රංග භාණ්ඩ ලෙස භාවිත කරන නර්තන අංග පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
(1) අස්න සහ උෟරා යක්කම
(2) පොල් පදය සහ මුවමල විදීම
(3) මඩුපුරය සහ කෝල්පාඩුව
(4) මඩුපුරය සහ දුනුමාලප්පුව

**36.** "තා - කු තක්කුං තරිකිට තකුඳ තත් ජෙං..." මෙය,
(1) දෙතිතට අයත් කස්තිරමකි. (2) දෙතිතට අයත් අඩව්වකි.
(3) තනි තිතට අයත් කස්තිරමකි. (4) තනි තිතට අයත් අඩව්වකි.

**37.** ගැටබෙරයෙන් වාදනය කළ හැකි වාදනාංග ඇතුළත් වරණය කුමක් ද?
(1) මඟුල් බෙර සහ අත්‍යා බෙර (2) අණ බෙර සහ යක්තුන් පදය
(3) යක්තුන් පදය සහ තෙල්මෙ පද (4) මඟුල් බෙර සහ රණ බෙර

**38.** "දොං තකු දොං ජිංතත් ජිංතත් ජිං තරිකිට" මෙම බෙර පදය අයත් වන්නේ,
(1) මාත්‍රා 12 + 12 + 1234 (2) මාත්‍රා 12 + 1234
(3) මාත්‍රා 12 + 12 + 123 (4) මාත්‍රා 12 + 123

**39.** මෙම අඩව්ව සම්පූර්ණ කිරීමට සුදුසු පද කොටස් ඇතුළත් වරණය තෝරන්න.
"තත් ................ තක රොං ................ තක්කඩ කුඳ තකරොං"
(1) තකට - තක්කඩ (2) තක්කඩ - තක්කඩ
(3) ජිත් - තකට (4) තක්කඩ - තකට

**40.** ගැටබෙරය හා සම්බන්ධ යෙදුම් සහිත වරණය තෝරන්න.
(1) හැක්ම සහ වලයම (2) කැපුම්හම සහ මණ්ඩම
(3) විග්ගුස්ස සහ අඬබෑය (4) බෙර පුහුල සහ සුරත් තට්ටුව

## III කොටස - පහතරට නර්තනය

**31.** පහතරට නර්තන සම්ප්‍රදායේ සුරල් පෑගීම ප්‍රගුණ කළ හැකි වන්නේ කීවෙනි ඉලංගම් සරඹය මගින් ද?
(1) 6 (2) 7 (3) 10 (4) 11

**32.** පහතරට බෙරයෙහි සුරල වාදනය (සුරල් පෙරළීම) පුහුණුවීම සඳහා වඩාත් යෝග්‍ය සරඹය තෝරන්න.
(1) ගුහිති ගහිති (2) තරි කඩ දිරි කඩ
(3) දෙගු දිරිකිට (4) තත් තත් කිටි තක

**33.** දෙවොල් මඩුවට අයත් චාරිත්‍ර විධියක් වන්නේ,
(1) මෙලෙයි යකුන් පිදීමයි. (2) මිල්ල කැපීමයි.
(3) අක්යාල වෙන් කිරීමයි. (4) හඟල යැදීමයි.

**34.** ශුද්ධ තාලය සින්දු වන්නම නර්තනය කළ හැකි තාල රූපය තෝරන්න.
(1) 2 + 3 (2) 2 + 4 (3) 2 + 2 + 3 (4) 2 + 2 + 4

Department of Examinations - Sri Lanka

Download all Past Papers>> https://bookbeekid.com/resource/past-papers/ 

35. පන්දම සහ කුඩය රංග භාණ්ඩ ලෙස භාවිත කරන නර්තන අංග පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
(1) වාහල සහ හත්පද පෙළපාළිය
(2) හත්පද සහ දොළහ පෙළපාළිය
(3) තෙල්මෙ සහ තොරන්යාගය
(4) තෙල්මෙ සහ දොළහ පෙළපාළිය

36. "තත් ගුඳ ගත දිත් දිත් තෙයි....." මෙය,
(1) දෙතිතට අයත් ඉරට්ටියකි.
(2) තුන් තිතට අයත් ඉරට්ටියකි.
(3) දෙතිතට අයත් අන්තාඩියකි.
(4) තුන් තිතට අයත් අන්තාඩියකි.

37. පහතරට බෙරයෙන් වාදනය කරනු ලබන වාදනාංග ඇතුළත් වරණය තෝරන්න.
(1) මඟුල් බෙර සහ දෙවොල් පද
(2) මඟුල් බෙර සහ අත්‍යා බෙර
(3) පන්දම් පද සහ අණ බෙර
(4) තෙල්මෙ පද සහ යක්තුන් පදය

38. "ගුඳි ගුඳ ගුඳි ගුඳ ගත ගදිගත ගදිගත ගත" මෙම බෙර පදය අයත් වන්නේ,
(1) මාත්‍රා 2 + 2 + 4 තුන් තිතට ය.
(2) මාත්‍රා 2 + 4 දෙතිතට ය.
(3) මාත්‍රා 2 + 2 + 3 තුන් තිතට ය.
(4) මාත්‍රා 2 + 3 දෙතිතට ය.

39. මෙම ඉරට්ටිය සම්පූර්ණ කිරීමට සුදුසු පද කොටස් ඇතුළත් වරණය තෝරන්න.
"තකදිත් ................ කිත්තත් .................. තරිගත දිකුඳම්"
(1) තකදොම් – කිටිතක
(2) ගදිගත – ගුඳගත
(3) ගුංදත් – කිටිතක
(4) තකදොම් – ගදිගත

40. පහතරට බෙරය හා සම්බන්ධ යෙදුම් සහිත වරණය තෝරන්න.
(1) දෙරියන් තුනඟුල සහ සුරත් තට්ටුව
(2) බෙර පුහුල සහ හයිතට්ටුව
(3) සුරත් තට්ටුව සහ වලයම
(4) හයි තට්ටුව සහ වරපටි

## IV කොටස - සබරගමු නර්තනය

31. සබරගමු නර්තන සම්ප්‍රදායේ කැරකීම් ක්‍රමයක් ප්‍රගුණ කළ හැකි වනුයේ කීවෙනි දොඹින පදය මගින් ද?
(1) 5 (2) 7 (3) 9 (4) 11

32. දවුලෙහි සුරල වාදනය (සුරල් පෙරළීම) පුහුණුවීම සඳහා වඩාත් යෝග්‍ය සරඹය තෝරන්න.
(1) තකට ජිකට
(2) තකට ජික්කට
(3) තක් ජිකට
(4) තකට කිටිතක

33. පහන් මඩුවට අයත් චාරිත්‍ර විධියක් වන්නේ,
(1) හඟල යැදීම ය. (2) මිල්ල කැපීම ය. (3) පේ බත් යැදීම ය. (4) අයිලෙ යැදීම ය.

34. පට්ටුතල් මාත්‍රය නර්තනය කළ හැකි තාල රූපය තෝරන්න.
(1) 2 + 3 + 3 (2) 2 + 2 + 4 (3) 3 + 2 + 2 (4) 4 + 2 + 2

35. පන්දම සහ පොල්මල රංග භාණ්ඩ ලෙස භාවිත කරන නර්තන අංග පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
(1) මුගුරු පද සහ මුදුන් තාලය
(2) යහන් දැක්ම සහ මුගුරු පද
(3) පන්දම් පද සහ කොලොන්න පද
(4) දෙවොල් සහ මල්මඩුපුරය

36. "තාත් තත්ජිත් තකට තත්ජිත්" මෙය,
(1) තනි තිතට අයත් අඩව්වකි.
(2) දෙතිතට අයත් අඩව්වකි.
(3) තනි තිතට අයත් කලාසමකි.
(4) දෙතිතට අයත් කලාසමකි.

37. දවුලෙන් වාදනය කරනු ලබන වාදනාංග ඇතුළත් වරණය තෝරන්න.
(1) මංගල දවුල්, අණ බෙර
(2) මංගල දවුල්, අත්‍යා බෙර
(3) අත්‍යා බෙර, රණ බෙර
(4) මංගල දවුල්, යක්තුන් පදය

Download all Past Papers>> https://bookbeekid.com/resource/past-papers/

**38.** "ජිංතක ජිං ජිමිතත් තත්තක තත් කිටිකත" මෙම බෙර පදය අයත් වන්නේ,

(1) මාත්‍රා $2+2+4$ තුන් තිතට ය.
(2) මාත්‍රා $2+4$ දෙතිතට ය.
(3) මාත්‍රා $2+2+3$ තුන් තිතට ය.
(4) මාත්‍රා $2+3$ දෙතිතට ය.

**39.** මෙම අඩව්ව සම්පූර්ණ කිරීමට සුදුසු පද කොටස් ඇතුළත් වරණය තෝරන්න.
"ගත්තකු ................ දොංගඩ තරිකිට .................. දොං කුඳ ගත කුඳ"

(1) ජිත්තත් - ජිත්තත්
(2) ජිත්තම් - ජිජිකුඳ
(3) ජිංදොං - තකුජිත්
(4) ජිංකුඳ - ජිං දොං

**40.** සබරගමු දවුල හා සම්බන්ධ යෙදුම් සහිත වරණය තෝරන්න.

(1) මණ්ඩම සහ බෙර පුහුල
(2) සුරත් තට්ටුව සහ ගැටිය
(3) හැක්ම සහ ඉල්ලම්
(4) ගැටිය සහ කඩිප්පුව

* *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

රහස්‍යයි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2020**
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2020

| විෂය අංකය<br>பாட இலக்கம் | 44 | විෂයය<br>பாடம் | **නැටුම් (දේශීය)** |
|---|---|---|---|

**I පත්‍රය - පිළිතුරු**
**Iபத்திரம் - விடைகள்**

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරෙහි අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 2 | 21. | 2 | 31. | 3 |
| 2. | 3 | 12. | 3 | 22. | 2 | 32. | 1 |
| 3. | 1 | 13. | 4 | 23. | 1 | 33. | 2 |
| 4. | 3 | 14. | 1 | 24. | 2 | 34. | 3 |
| 5. | 2 | 15. | 2 | 25. | 3 | 35. | 4 |
| 6. | 4 | 16. | 4 | 26. | 4 | 36. | 2 |
| 7. | 3 | 17. | 4 | 27. | 1 | 37. | 1 |
| 8. | 4 | 18. | 3 | 28. | 2 | 38. | 4 |
| 9. | 2 | 19. | 3 | 29. | 2 | 39. | 1 |
| 10. | 1 | 20. | 1 | 30. | 1 | 40. | 4 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු/ மொத்தப் புள்ளிகள் **01×40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25/40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25/40 |
|---|---|---|---|


Download all Past Papers>> https://bookbeekid.com/resource/past-papers/

## 44 - නැටුම් (දේශීය)

## II ප්‍රශ්න පත්‍රයෙහි අදාළ ඉගෙනුම් ඵල

1. උඩරට, පහතරට, සබරගමු, නර්තන සම්ප්‍රදායන්හි ඓතිහාසික තොරතුරු පිළිබඳව අධ්‍යයනය කරමින් විචාරශීලිව කරුණු දක්වයි.

2. කෝලම් හා සොකරි නාටකයන්හි, ආවේනික ලක්ෂණ හඳුනාගනිමින් විචාරාත්මකව කරුණු දක්වයි.

3. ප්‍රස්තාරකරණයේ මුලධර්ම නිවැරදිව හඳුනාගනිමින් බෙරපද හා ගායනවල ප්‍රස්තාර භාවිතය නිවැරදිව පෙන්වා දෙයි.

4. ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය සහ මුද්‍රා නාට්‍ය නිර්මාණකරුවන් පිළිබඳව විචාරාත්මකව කරුණු ප්‍රකාශ කරයි.

5. නර්තන කලාවෙන් ලැබෙන මානසික සහ ශාරීරික සුවතාව පිළිබඳව කරුණු සඳහන් කරයි.

6. ප්‍රාසංගික කලාංග නිර්මාණකරණයෙහි විශේෂතා පිළිබඳ සැලකිලිමත්ව කරුණු විග්‍රහ කරයි.

Department of Examinations - Sri Lanka



Download all Past Papers>> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

**නැටුම් (දේශීය) I, II**
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

## නැටුම් (දේශීය) II

※ **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
※ **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **12** බැගින් හිමි වේ.

**1.** **සියලු ම** ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ **අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

(i) රස නිෂ්පත්තිය සඳහා ප්‍රධාන වන ස්ථායි භාව සංඛ්‍යාව .................. කි.

(ii) ග්‍රහපංති කවි විශේෂය ගායනා කරනු ලබන්නේ .................. ශාන්තිකර්මයේ දී ය.

(iii) ප්‍රාසංගික බව තීව්‍ර කිරීමට යොදා ගන්නා රංග වස්ත්‍රාභරණ අයත් වන්නේ ..................... අභිනයට ය.

(iv) මාත්‍රා 2 + 2 + 3 තාල රූපය හඳුන්වන්නේ .................. තිතේ ප්‍රභේදයක් ලෙසිනි.

(v) 14 වන සියවසේ දෙවිනුවර උපුල්වන් දේවාලයේ, දේවදාසින් පිළිබඳ ව දේශාටන වාර්තා සටහනක් තබන ලද පුද්ගලයා වන්නේ, ............................................... ය.

(vi) රුප්පා යකුන් පිදීම හා මෙලෙයි යකුන් පිදීම යන චාරිත්‍ර විධි අයත් වන්නේ ............................. ශාන්තිකර්මයට ය.

(vii) වෙන්ඩාව හා වෙංගිලම් වාද්‍ය භාණ්ඩ දෙක භාවිත කරනුයේ ........................ නර්තන සම්ප්‍රදායට ය.

(viii) කුඹී කතාව මුද්‍රා නාට්‍යයේ රංග රචනය කරන ලද්දේ .............................. විසිනි.

(ix) කරදිය මුද්‍රා නාට්‍යයේ සංගීත නිර්මාණය සහ නර්තන නිර්මාණය කළ ශිල්පීන් **දෙදෙනා** නම් කරන්න.

(අ) සංගීත නිර්මාණය :- ....................................

(ආ) නර්තන නිර්මාණය :- ....................................

(x) හිරෝෂිමා සහ භාව චලන මුද්‍රා නාට්‍ය නිර්මාණය කළ ප්‍රවීණ කලාකරුවන් **දෙදෙනා** කවුරුන් ද?

(අ) හිරෝෂිමා :- ....................................

(ආ) භාව චලන :- ....................................

**2.** පහත දැක්වෙන බෙර පද අතුරෙන් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අදාළ බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.

(i) ※ දොං ජිං ජිං තකට දොංතක

※ ගුංද ගතිගත ගත්ත ගුදිගුද

※ කුඳත් තක්කිට තකට ජිමිතකු

(ii) පහත දැක්වෙන කවි පද, මාත්‍රා තුනේ තනි තිතට ප්‍රස්තාර කරන්න.

"අතකට ගෙන රබන් පොඩිය ගසති දිසි රුවින්
ගත පිට බඳ සොලවා සිලි සිලි නද කරමින්"

(iii) මාත්‍රා 3 + 4 තාලයට අයත් අඩව්වක්/ඉරට්ටියක් ප්‍රස්තාර කරන්න.

**3.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) හේවිසි වාදනය
(ii) සාත්ත්වික අභිනය
(iii) වජිරා චිත්‍රසේන
(iv) ථීකා සීපද
(v) ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍යය




Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

4. ශාන්තිකර්මවලට ආවේණික වූ ගායන, නාට්‍යමය පෙළපාළි සහ ඇඳුම් පැළඳුම්වලින් ඒවායේ සමාජ පසුබිම පිළිබඳ ව තොරතුරු විවරණය කෙරේ.
   (i) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ එන නාට්‍යමය පෙළපාළි **හතරක්** නම් කරන්න.
   (ii) සබරගමු පහත් මඩුවේ ගායන සහිත නර්තනාංග **දෙකක්** පිළිබඳ ව හැඳින්වීමක් කරන්න.
   (iii) පහතරට දෙවොල් මඩුව ශාන්තිකර්මයේ එන කතාපුවතින් සමාජ විවරණය කෙරෙන ආකාරය සාකච්ඡා කරන්න.

5. (i) සොකරි ගැමි නාටකයේ පුද ලබන දෙවිවරු **දෙදෙනෙක්** හා ප්‍රචලිත ප්‍රදේශ **දෙකක්** නම් කරන්න.
   (ii) සොකරි සහ කෝලම් නාටකයන්හි රංගවස්ත්‍රාභරණවල වෙනස්කම් **දෙකක්** වෙන්කොට දක්වන්න.
   (iii) කෝලම් නාටකයෙහි එන මානුෂ චරිතයක් නිරූපණයේ දී සිදුවන සමාජ ශෝධනය පිළිබඳ ව විචාරයට ලක් කරන්න.

6. ශ්‍රී ලාංකේය නර්තන කලාව ආගමික, සමාජීය හා අධ්‍යාපනික වශයෙන් වඩාත් සංවර්ධනය වී ඇති බව ඓතිහාසික තොරතුරු මඟින් ගම්‍ය වේ.
   (i) 1970න් පසු නර්තන කලාවේ අධ්‍යාපනික සංවර්ධනයට විශේෂ වූ කරුණු **හතරක්** ලියන්න.
   (ii) නර්තන කලාවට ලැබුණු රාජ්‍ය අනුග්‍රහය පිළිබඳ ව මහා වංශයේ සාධක **දෙකක්** ඇසුරෙන් පෙන්වා දෙන්න.
   (iii) මහනුවර යුගයේ දී නර්තන කලාව පැවති තත්ත්වය පිළිබඳ ව ආගමික සහ සමාජීය පසුබිම සම්බන්ධ කරුණු **දෙකක්** යටතේ විමසුමට ලක් කරන්න.

7. පහත දැක්වෙන රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B



C

   (i) **A** රූපයේ දැක්වෙන ක්‍රියාකාරකම්වලින් යහපත් දිවි පෙවෙතකට ලැබෙන පිටිවහල පිළිබඳ ව කරුණු **හතරක්** ලියා දක්වන්න.
   (ii) **B** රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායෙහි භාවිත වන අවනද්ධ භාණ්ඩයක් හා තත් භාණ්ඩයක් නම් කර ඉන් **එකක්** පිළිබඳ ව විස්තරයක් කරන්න.
   (iii) **C** රූපයේ දැක්වෙන ප්‍රාසංගික කලාංග නිර්මාණකරණයේ දී සැලකිය යුතු කරුණු පිළිබඳ ව විමසුමක් කරන්න.

* * *

Department of Examinations - Sri Lanka

# 44 - නැටුම් (දේශීය) - II

| | | | | ලකුණු | |
|---|---|---|---|---|---|
| 1. | (i) | නවය | | 1 | |
| | (ii) | බලි | | 1 | |
| | (iii) | ආහාර්ය | | 1 | |
| | (iv) | තුන් | | 1 | |
| | (v) | ඉබන් බතුනා | | 1 | |
| | (vi) | කොහොඹාකංකාරිය | | 1 | |
| | (vii) | කතකලි | | 1 | |
| | (viii) | අංජලිකා චිත්‍රසේන | | 1 | |
| | (ix) | (අ) | ඩබ්ලිව්.ඩී. අමරදේව | 1 | 2 |
| | | (ආ) | චිත්‍රසේන ඩයස් | 1 | |
| | (x) | (අ) | වසන්ත කුමාර | 1 | 2 |
| | | (ආ) | ශේෂා පලිහක්කාර | 1 | |

(i) සිට (viii) දක්වා පිළිතුරකට ලකුණු 01 බැගින් - ලකුණු 08

(ix) සිට (x) දක්වා පිළිතුරකට ලකුණු 02 බැගින් - ලකුණු 04

**මුළු ලකුණු** (8 + 4) = 12

Department of Examinations - Sri Lanka



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**2.** පහත දැක්වෙන බෙර පද අතුරෙන් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අදාළ බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.

(i) ❊ දොං ජිං ජිං තකට දොංතක

❊ ගුංද ගතිගත ගත්ත ගුඳිගුඳ

❊ කුඳත් තක්කිට තකට ජිමිතකු

<u>**උඩරට නර්තන සම්ප්‍රදාය**</u>

බෙර පදය - දොං ජිං ජිං තකට දොංතක

| ∧ | | | / | | | | ∧ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| දොං | - | - | ජිං | - | ජිං | - | ත | ක | ට | දොං | - | ත | ක |

<u>**පහතරට නර්තන සම්ප්‍රදාය**</u>

බෙර පදය - ගුංද ගතිගත ගත්ත ගුඳි ගුඳ

| ∧ | | | / | | | | ∧ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| ගුං | - | ද | ග | ති | ග | ත | ගත් | - | ත | ගු | ඳි | ගු | ඳ |

<u>**සබරගමු නර්තන සම්ප්‍රදාය**</u>

බෙර පදය - කුඳත් තක්කිට තකට ජිමිතකු

| ∧ | | | / | | | | ∧ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| කු | ඳත් | - | තක් | - | කි | ට | ත | ක | ට | ජි | මි | ත | කු |

විභාග කර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02

බෙර පදය ප්‍රස්තාර කිරීමට - ලකුණු 02

**ලකුණු 04**

Department of Examinations - Sri Lanka



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(ii) පහත දැක්වෙන කවි පද, මාත්‍රා තුනේ තනි තිතට ප්‍රස්තාර කරන්න.
"අහකට ගෙන රබන් පොඩිය ගසති දිසි රුවින්
ගත පිට බඳ සොලවා සිලි සිලි නද කරමින්"

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| + | අහ | ක | ට | ගෙ | න | ර | බන් | - | පො | ඩි | ය |
| + | ගස | ති | දි | සි | රු | වින් | - | - | - | - | - |
| + | ගත | පි | ට | බ | ඳ | සො | ල | වා | - | සි | ලි |
| + | සිලි | න | ද | ක | ර | මින් | - | - | - | - | - |

විභාග කර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02
කවි පද ප්‍රස්තාර කිරීමට - ලකුණු 02

**ලකුණු 04**

(iii) මාත්‍රා 3 + 4 තාලයට අයත් අඩව්වක්/ඉරට්ටියක් ප්‍රස්තාර කරන්න.

3 + 4 තාලයට උඩරට අඩව්වක්

| ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| තා | - | කු | තක් | කුං | තරි | කිට | ත | කු | ඳ | තත් | - | ජෙං | - |
| - | - | - | තත් | - | ජෙං | - | ත | ජෙං | - | තත් | - | ජෙං | - |
| ජි | - | කු | ජික් | කුං | තරි | කිට | ජි | කු | ඳ | තත් | - | ජෙං | - |
| - | - | - | තත් | - | ජෙං | - | ත | ජෙං | - | තත් | - | ජෙං | - |
| තා | - | කු | තක් | කුං | තරි | කිට | ත | කු | ඳ | තත් | - | ජෙං | - |
| ජි | - | කු | ජික් | කුං | තරි | කිට | ජි | කු | ඳ | තත් | - | ජෙං | - |
| තා | - | කු | තක් | කුං | තරි | කිට | ජි | - | කු | ජික් | කුං | තරි | කිට |
| ත | කු | ඳ | තත් | - | ජෙං | - | - | - | - | තත් | - | ජෙං | - |
| ත | ජෙං | - | තත් | - | ජෙං | - | - | - | - | ජෙං | - | තා | - |
| ජෙ | තා | - | ජෙං | ත | කු | ඳ | ජෙං | - | ත | තා | - | - | - |

| ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| තත් | - | ත | ත | රි | ත | රි | ත | ත | රි | ත | රි | ත | රි |
| රු | ඳ | ග | ජි | මි | ජි | මි | ති | තිත් | - | තෙයි | - | - | - |
| ත | තත් | - | ජිත් | - | ජිත් | - | තො | තොං | - | නං | - | නං | - |
| රු | ඳ | ග | ජි | මි | ජි | මි | ති | තිත් | - | තෙයි | - | - | - |

Department of Examinations - Sri Lanka

Download all Past Papers>> https://bookbeekid.com/resource/past-papers/

පහතරට ඉරට්ටිය

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ^ | | | / | | | | ^ | | | / | | | |
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| දොං | - | ත | ගත් | - | තත් | - | ග | දි | ත | ගත් | - | තත් | - |
| ග | ත | ගු | ඳං | - | ග | ත | ග | දි | ත | ගුං | - | දිත් | - |
| තා | - | - | | | | | | | | | | | |

සබරගමු අඩව්ව

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ^ | | | / | | | | ^ | | | / | | | |
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| + | + | + | ගත් | - | තත් | - | ග | ති | ත | ග | ත | දොං | - |
| ජිං | - | ත | ග | ත | ග | ත | ග | ති | ත | ග | ත | දොං | - |
| ජිං | - | ත | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ඳ | ග | ත |
| ජිං | - | ත | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ඳ | ග | ත |
| තා | - | - | | | | | | | | | | | |

**" තාත් තත්ජිත් තකට තත් ජිත්............. " යන අඩව්ව වුවද නිවැරදිව ප්‍රස්තාර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න**

විභාග කර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02
අඩව්ව / ඉරට්ටිය ප්‍රස්තාර කිරීමට - ලකුණු 02

**ලකුණු** 04

**මුළු ලකුණු** (4 x 3) = 12

**3.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
(i) හේවිසි වාදනය
(ii) සතර අභිනය
(iii) වජිරා චිත්‍රසේන
(iv) ඊකා සීපද
(v) ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍යය

**(i) හේවිසි වාදනය :-**

- දවුල, තම්මැට්ටම හා හොරණෑව භාවිතා කරන බව.
- පූජාර්ථය මතුවන වාදන අවස්ථාවක් බව.
- බෞද්ධාගමික මුහුණුවරක් ගන්නා බව.
- පෙරහැර අවස්ථාවන් වලදී දක්නට ඇති බව.
- විශේෂිත වාදන අවස්ථා සඳහා යොදා ගන්නා බව.
  උදා (අඹරා හේවිසි, ගෙවැදුම් හේවිසි, .................)

කරුණු හතරක් ලියා තිබේනම් ලකුණු 04

Department of Examinations - Sri Lanka

Download all Past Papers>> https://bookbeekid.com/resource/past-papers/

**(ii)** **සතර අභිනය :-**

- අභිනය යන්න නිර්වචනය කර ඇත්නම්
- සතර අභිනය නම්කර ඇත්නම්
- ප්‍රකාශන විධික්‍රම ලෙස සතර අභිනය භාවිත අවස්ථා නම් කර තිබේනම්.
- භරත මුනි හා නන්දිකේශ්වරයන්ගේ ග්‍රන්ථ ඇසුරින් තොරතුරු දක්වා තිබේනම්.

කරුණු **හතරක්** සඳහා
**ලකුණු** 04

**(iii)** **වජිරා චිත්‍රසේන :-**

- චිත්‍රසේන මහතාගේ බිරිඳ මෙන්ම උඩරට නර්තනයට දක්ෂ කාන්තාවක් බව.
- තාණ්ඩව ලක්ෂණවලට ලාස්‍ය ලක්ෂණ මුසුකරමින් කාන්තාවන්ට උචිතවූ නර්තන නිර්මාණ කළ බව.
- ළමා මුද්‍රා නාට්‍ය කලාවක් හඳුන්වාදීමේ ගෞරවය මෙතුමියට හිමිවන බව.
- රන් කිකිළි, ගිනිහොරා, හපනා,..... වැනි මුද්‍රා නාට්‍ය ගණනාවක් නිෂ්පාදනය කරමින් ජනාදරයට පත් වූ බව.
- කාන්තාවන්ට සුදුසු නිර්මාණශීලි ඇඳුම් කට්ටලයක් සකස් කිරීමට පුරෝගාමී වූ බව.
- කරදිය, නල දමයන්ති මුද්‍රා නාට්‍ය සඳහා නර්තනයෙන් දායකත්වය ලබා දුන් බව.

ඉහත කරුණු **හතරක්** ලියා තිබේ නම්
**ලකුණු** 04

**(iv)** **ඊකා සීපද :-**

- ගැමි ගී අතර සුවිශේෂ ගායනා ක්‍රමයක් බව.
- ගද්‍ය හා පද්‍ය ලක්ෂණයෙන් මෙන්ම අඝාතාත්මක හා අනාඝාතාත්මකව ගැයෙන බව.
- හාස්‍යය, උපහාසය, ව්‍යාංගාර්ථ, අතිශෝක්තිය ........ මතුවන බව.
- පාළුව, තනිකම .... මඟ හරවා ගැනීමට මෙන්ම විනෝදාස්වාදය සඳහා ද ගායනය කළ බව.
- උදාහරණ ලෙස ඊකා සීපද ලියා තිබීම.

ඉහත කරුණු **හතරක්වත්** ලියා තිබේ නම්
**ලකුණු** 04

**(v)** **ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍යය :-**

- දේශීය නර්තන සම්ප්‍රදායන් හා භාරතීය නර්තනයේ ආභාෂය ලබා ඇති බව.
- තාලානුකූල හා ප්‍රකාශනාත්මක චලන වැඩි වශයෙන් දක්නට ඇති බව.
- නර්තන චලන සඳහා සංගීතය හා යොදා ගන්නා බව.
- ඉඟිනළු නමින් හඳුන්වන බව.
- භාරතීය හා දේශීය ලක්ෂණ රංගවස්ත්‍රාභරණවලින් ඉස්මතු වන බව.
- දේශීය නාට්‍ය වර්ග අතුරින් මුද්‍රා නාට්‍ය සුවිශේෂ වන බව.

ඉහත කරුණුවලින් **හතරක්** ලියා තිබේ නම්
**ලකුණු** 04

**මෙයින් තුනක් තෝරා ගෙන කෙටි සටහන් ලියා ඇත්නම් මුළු ලකුණු** **(4 x 3)** = 12

Department of Examinations - Sri Lanka

4. ශාන්තිකර්මවලට ආවේණික වූ ගායන, නාට්‍යමය පෙළපාළි සහ ඇඳුම් පැළඳුම්වලින් ඒවායේ සමාජ පසුබිම පිළිබඳ ව තොරතුරු විවරණය කෙරේ.

(i) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ එන නාට්‍යමය පෙළපාළි **හතරක්** නම් කරන්න.

- ඌරා යක්කම, නයා යක්කම, වැදි යක්කම. .............. ආදි
- ගුරුගේ මාලාව
- ගබඩාකොල්ලය

ආදී වශයෙන් හතරක් නම් කරඇත්නම්

ලකුණු 04

(ii) සබරගමු පහන් මඩුවේ ගායන සහිත නර්තනාංග **දෙකක්** පිළිබඳ ව හැඳින්වීමක් කරන්න.

- දළුමුර පාළිය, අගුරු දුම්මල පාලිය, තැඹිලි පාලිය,කෙණ්ඩි පාලිය ........ආදි
- දෙවොල්
- තෙල්මේ
- මල් මඩු පුරය

නර්තන අංග දෙකක් නම් කිරීමට ලකුණු - 02

කෙටි හැඳීන්වීමට ලකුණු - 02

**මුළු ලකුණු** 04

(iii) පහතරට දෙවොල් මඩුව ශාන්තිකර්මයේ එන කතාපුවතින් සමාජ විවරණය කෙරෙන ආකාරය සාකච්ඡා කරන්න.

- ප්‍රාණඝාත අකුසලය
- වෛරය, ක්‍රෝධය, පලිගැනීම හා නොඉවසීම
- කළකම් පළදීම
- දුරදිග නොබලා තීරණ ගැනීම වැනි මානව සමාජ පසුබිමෙහි එන අයහපත් ක්‍රියා හේතුවෙන් දඩුවම් අත්වීදීම.

සමාජ විවරණය කෙරෙන ආකාරය සාකච්ඡා කර ඇත්නම් ලකුණු 04

**මුළු ලකුණු** **(4 x 3)** = 12

5. (i) සොකරි ගැමි නාටකයේ පුද ලබන දෙවිවරු **දෙදෙනෙක්** හා ප්‍රචලිත ප්‍රදේශ **දෙකක්** නම් කරන්න.

- දෙවිවරු - කතරගම දෙවි, පත්තිනි දේවිය.
- ප්‍රචලිත ප්‍රදේශ - උඩරට, වන්නිය, බදුල්ල, හඟුරන්කෙත, මාතලේ, දික්පිටිය, කළුන්දෑව................................

දෙවිවරු දෙදෙනෙක් නම් කිරීමට ලකුණු 02

ප්‍රචලිත ප්‍රදේශ දෙකක් නම් කිරීමට ලකුණු 02

**ලකුණු** 04

Department of Examinations - Sri Lanka

(ii) සොකරි සහ කෝලම් නාටකයන්හි රංගවස්ත්‍රාභරණවල වෙනස්කම් **දෙකක්** වෙන්කොට දක්වන්න.

- චරිත ස්වාභාවය තීව්‍ර කිරීම සඳහා එකිනෙකට වෙනස් රංගවස්ත්‍ර භාවිත කරන බව.
- වෙස් මුහුණු භාවිත කිරීමේදී විවිධ චරිතවලට අනුකූලව වෙනස්කම් දක්වා ඇත්නම්.
- රංගවස්ත්‍රාභරණවල සරල හා සංකීරණ බව.

වෙනස්කම් දෙකක් වෙන්කොට හඳුනාගෙන ඇත්නම්
**ලකුණු** 04

(iii) කෝලම් නාටකයෙහි එන මානුෂ චරිතයක් නිරූපණයේ දී සිදුවන සමාජ ශෝධනය පිළිබඳ ව විචාරයට ලක් කරන්න.

- ජසයා, ලෙන්චිනා, අණ බෙර, නොන්චි, මුදලි, වැනි........ චරිතයක් හඳුනාගෙන ඇත්නම්
ලකුණු 01
- චරිත නිරූපණයේදී ගායන, වාදන, නර්තන ඇසුරෙන් සමාජ ශෝධනය විචාරයට ලක් කර ඇත්නම් ලකුණු 03

**මුළු ලකුණු** (4 x 3) = 12

6. ශ්‍රී ලාංකේය නර්තන කලාව ආගමික, සමාජීය හා අධ්‍යාපනික වශයෙන් වඩාත් සංවර්ධනය වී ඇති බව ඓතිහාසික තොරතුරු මගින් ගම්‍ය වේ.
(i) 1970න් පසු නර්තන කලාවේ අධ්‍යාපනික සංවර්ධනයට විශේෂ වූ කරුණු **හතරක්** ලියන්න.

- 1972 දී රජයේ පාසල්වලට සෞන්දර්ය විෂය අනිවාර්ය වීම.
- 1972 වර්ෂයේ හිරාගම සෞන්දර්ය ගුරු විද්‍යාලයය ආරම්භ වීම.
- 1978 වර්ෂයේ අ.පො.ස. (උ.පෙළ.) සඳහා නර්තන විෂයක් වශයෙන් ඇතුළත් වීම.
- උසස් අධ්‍යාපන සඳහා 1974 වර්ෂයේ දී විශ්වවිද්‍යාලයට අනුබද්ධ කොට සෞන්දර්ය අධ්‍යයන ආයතන ආරම්භ වීම.
- 2005 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යයන ආයතනය පූර්ණ විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීම.
- නර්තන විෂය සඳහා ආචාර්යවරුන්, මහාචාර්යවරුන් බිහිවීම.
- උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වීමට අවස්ථාව උදාවීම.

කරුණු හතරක් ලියා ඇත්නම් ලකුණු 04

(ii) නර්තන කලාවට ලැබුණු රාජ්‍ය අනුග්‍රහය පිළිබඳ ව මහා වංශයේ සාධක **දෙකක්** ඇසුරෙන් පෙන්වා දෙන්න.

- පණ්ඩුකාභය රජු කාලවේල, චිත්තරාජ යන යක්ෂයින් උදෙසා සම අසුන් පනවා තමා ඉදිරියේ දෙව් මිනිස් නැටුම් කරවු බව.
- දුටුගැමුණු රජු නලඟනන් පිරිවරා රුවන්වැලි මහා සෑයේ ධාතු නිධන් කිරීමේ උත්සවයට ගියබව.
- මහාදාඨික මහානාග රජු ගිරිභණ්ඩ පූජා පැවැත් වූ බව.

ඉහත කරුණු දෙකක් ඇසුරෙන් පෙන්වා ඇත්නම්
ලකුණු 04

Department of Examinations - Sri Lanka


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iii) මහනුවර යුගයේ දී නර්තන කලාව පැවති තත්ත්වය පිළිබඳ ව ආගමික සහ සමාජීය පසුබිම සම්බන්ධ කරුණු **දෙකක්** යටතේ විමසුමට ලක් කරන්න.

ආගමික පසුබිම

- දළඳා පෙරහැර ඇසුරෙන් ආගමික පසුබිම විස්තර කර තිබේ නම්.
- ආගමික වත් පිළිවෙත් / චාරිත්‍ර පිළිබඳව විදේශිකයින්ගේ ඓතිහාසික වාර්තා ඇසුරෙන් විස්තර කර තිබේ නම්.

සමාජීය පසුබිම

- දළඳා පෙරහැරේ චාරිත්‍ර ඇසුරෙන් සමාජීය පසුබිම විස්තර කර ඇත්නම්.
- විවිධ කුල පරම්පරාවන් සහභාගී වීම ඇසුරෙන් සමාජීය පසුබිම විස්තර කර ඇත්නම්.
- රජවාසල හා සම්බන්ධ ඉලංගම් පහක් පිහිටුවා ගැනීම හා විවිධ නර්තන කණ්ඩායම් පවත්වාගෙන ගිය බව.

ආගමික පසුබිම යටතේ කරුණු විමසුමට ලක්කර ඇත්නම්
ලකුණු 02

සමාජීය පසුබිම යටතේ කරුණු විමසුමට ලක්කර ඇත්නම්
ලකුණු 02

ලකුණු 04


**මුළු ලකුණු (4 x 3)** = 12

Department of Examinations - Sri Lanka



Download all Past Papers>> https://bookbeekid.com/resource/past-papers/


**7.** පහත දැක්වෙන රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B



C

(i) **A** රූපයේ දැක්වෙන ක්‍රියාකාරකම්වලින් යහපත් දිවි පෙවෙතකට ලැබෙන පිටිවහල පිළිබඳ ව කරුණු **හතරක්** ලියා දක්වන්න.

- රුධිර සංසරණ පද්ධතියේ ක්‍රියාකාරිත්වය සිදුවන බව.
- මාංශපේෂිවල ක්‍රියාකාරිත්වය ශක්තිමත් වන බව.
- ශරීර නම්‍යතාව, ස්ථූල බව අඩුවීම, ශරීර ශක්ති වර්ධනය..... වනබව.
- සමබරතාවය, මානසික සංයමය, ඉවසීමේ ගුණය, දරා ගැනීමේ හැකියාව....... ආදිය ඇතිවන බව.

කරුණු හතරක් ලියා ඇත්නම් ලකුණු 04

(ii) **B** රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායෙහි භාවිත වන අවනද්ධ භාණ්ඩයක් හා තත් භාණ්ඩයක් නම් කර ඉන් **එකක්** පිළිබඳ ව විස්තරයක් කරන්න.

**පුංග් බෙරය**

- බෙර කඳ දැවයෙන් සහ වරපට සම්වලින් නිමකර ඇති බව.
- සුදු රෙදි කඩකින් බෙරකඳ ආවරණය කර ඇති බව.
- බෙර ඇස දෙපස ස්ථාවර බදාමයක් යොදා ඇති බව.
- මනිපුරි නර්තනයේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය වන බව.

Department of Examinations - Sri Lanka

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**පෙනා**

- ලයහරෝබා නර්තනයේ ප්‍රධාන තත්වාද්‍ය භාණ්ඩය වන බව.
- එක් තතක් පමණක් ඇති වාද්‍ය භාණ්ඩයක් බව.
- පොල් කටුවක්, උණ ලීයක් සහ අශ්වකෙඳී ආධාරයෙන් නිමවා ඇති බව.
- ඇළුවකින් වාදනය කරන බව.

වාද්‍ය භාණ්ඩ දෙක නම් කිරීමට ලකුණු 02
එක් වාද්‍ය භාණ්ඩයක් විස්තර කිරීමට ලකුණු 02
**ලකුණු** 04

(iii) **C** රූපයේ දැක්වෙන ප්‍රාසංගික කලාංග නිර්මාණකරණයේ දී සැලකිය යුතු කරුණු පිළිබඳ ව විමසුමක් කරන්න.

- රංගවින්‍යාසය පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.
- ගැලපෙන ශාරීරික අංග චලන භාවිතය.
- අවකාශයේ, තල, දිසා, සම්බන්ධතා.
- නිර්මාණාත්මක සංගීතය, වාදනය.
- විචිත්‍ර රංගවස්ත්‍රාභරණ නිර්මාණය හා වේෂ නිරූපණය.
- තාක්ෂණික ක්‍රම ශිල්ප භාවිතය.

කරුණු හතරක් ඔස්සේ විමසුමක් කර ඇත්නම් ලකුණු 04

**මුළු ලකුණු** (4 x 3) = 12

Department of Examinations - Sri Lanka

Download all Past Papers>> https://bookbeekid.com/resource/past-papers/